Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි
*All Rights Reserved*

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# අනාවරණ පරීක්ෂණය 2021

# බුද්ධ ධර්මය

**7 ශ්‍රේණිය** **කාලය පැය 02 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි

- පළමු කොටසේ සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- දෙවන කොටසේ පළමු පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

---

## I - කොටස

- **ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01 බෝධිසත්වයන් වහන්සේ පස්වන සතිය ගත කළේ,

(i) මිදෙල්ල ගස මුල (ii) ජයශ්‍රී මහ බෝ මුල

(iii) අජපාල නුග රුක මුල (iv) රුවන් සක්මනේ

02 බුදුන් හා දහම් සරණ ගිය පළමු (ද්වෙවාචික) උපාසකවරුන් නම්,

(i) තපස්සු භල්ලුක (ii) යස හා යහලුවන්

(iii) භද්දවග්ගිය කුමාරවරු (iv) පස්වග මහණුන්

03 පස්වග තවුසන්ට දේශනා කළ සූත්‍රය,

(i) රතන සූත්‍රය (ii) දම්සක් පැවතුම් සූත්‍රය

(iii) කරණීයමෙත්ත සූත්‍රය (iv) මහ මංගල සූත්‍රය

04 බුදුරජාණන් වහන්සේගේ අනුකම්පාට ලක් වූ කුඩා දරුවෙකි,

(i) පාටාචාරා (ii) කිසාගෝතමිය (iii) සෝපාක (iv) රජ්ජුමාලා

05 උපස්ථායකයකු තුළ නොතිබිය යුතු ගුණාංගයකි

(i) රෝගියාට අවශ්‍ය බෙහෙත් පිළියල කර දීම.

(ii) මල මුත්‍ර ආදිය කෙරෙහි පිළිකුල් නූපදවීම.

(iii) රෝගියාගේ සිත සැනසෙන කතා පැවසීම.

(iv) ලාභ ප්‍රයෝජන අපේක්ෂාවෙන් උවටැන් කිරීම. (ලකුණු 1 x 5 = 05)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- **හිස්තැනට ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

(නවයකි / තොටගමුවේ ශ්‍රී රාහුල / අරහං / අනේපිඬු සිටුතුමා / කරණීය මෙත්ත සූත්‍රය)

06 බුදුරජාණන් වහන්සේ රහසින්වත් පව් නොකළ හෙයින් ද, ලෝභ ද්වේෂ මෝහාදි සියලු කෙළෙස් නැසූ හෙයින් ද, සියලු පූජාවන් ලැබීමට සුදුසු හෙයින් ද ........................................... ගුණයෙන් යුක්ත වන සේක.

07 අරහාදි බුදු ගුණ ගණනින් ................................................................................... කි.

08 කාව්‍යශේඛරය රචනා කළේ ............................................................................... හිමියන් විසිනි.

09 මෙත් වඩන්නෙකු තුළ තිබිය යුතු උසස් ගුණාංග ඇතුලත් වන්නේ ........................................................ සූත්‍රයේ මුල් කොටසෙහි ය.

10 බුදු සසුනේ අග්‍ර දායකයා ....................................................................................... තුමා ය.

(ලකුණු 1 x 5 = 05)

- **පහත සඳහන් පාඨ හරි නම් හරි ලකුණ ද (✓) වැරදි නම් වැරදි (×) ලකුණ ද යොදන්න.**

11 බුදු දහම පටිසෝතගාමී දහමකි. ( )

12 ගිහියාගේ නිත්‍ය ශීලය පංචශීලයයි. ( )

13 සිගාලෝවාද සූත්‍රයෙහි ගුරුවරු උතුරු දිශාවෙන් පෙන්වාදෙයි. ( )

14 අප මැනවින් හික්මවීම ගුරුදෙව්වරුන්ගේ උතුම් ගුණාංගයකි. ( )

15 නායකයකු සැමවිටම දුර්දක්නා නුවණින් යුක්ත නොවිය යුතුය. ( )

- **නිවැරදි පිළිතුරු යා කරන්න.**

| | **A** කොටස | | **B** කොටස |
|---|---|---|---|
| 16 | අස්වැන්නේ පළමු කොටස | (i) | කාම තන්හා |
| 17 | සමගියෙන් එක්ව ක්‍රියාකිරීම | (ii) | උතු නියාමය |
| 18 | කාලගුණික හේතු නිසා ඇත්වේ | (iii) | සම්මා දිට්ඨි |
| 19 | පංචේන්ද්‍රියන් පිනවීමට ඇති කැමැත්ත | (iv) | සහජීවනය |
| 20 | නිවැරදි දැකීම හෙවත් යහපත් අවබෝධය | (v) | අග්‍රශෂ්‍ය දානය |

(ලකුණු 1 x 5 = 05)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.**

01 (1) සත් සතියේ සතරවන සතියේ සිදු වූ වැදගත් සිදුවීම ලියන්න.

(2) බුදුරදුන්ගේ පිහිට ලැබූ අසරණ කාන්තාවන් දෙදෙනෙක් නම් කරන්න.

(3) නව අරහාදි බුදු ගුණ 4 ක් නම් කරන්න.

(4) චාරිත්‍ර වාරිත්‍ර කෙටියෙන් හඳුන්වන්න.

(5) පන්සලේදී අනුගමනය කළ යුතු හොඳ සිරිත් 2 ක් ලියන්න.

(6) මෙත් වඩන්නකු තුළ තිබිය යුතු ගුණාංග 2 ක් ලියන්න.

(7) පසු කලෙක ''මිගාර මාතා'' නමින් ප්‍රසිද්ධියට පත් වූ සිටු දියණිය කවුද?

(8) ගුරුවරුන් විසින් දරුවන්ට ඉටුකළ යුතු යුතුකම් 2 ක් ලියන්න.

(9) ගුරු සිත නොරිදවා - වේලාව නොවරදවා .... ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

(10) ත්‍රිවිධ රත්නය නම් කරන්න. (ලකුණු 2 x 10 = 20)

02 (i) පංචශීලය නම් කරන්න. (ල. 02)

(ii) විරතිය හා සමාදානය හඳුන්වන්න. (ල. 03)

(iii) පංචශීලය රැකීමෙන් ගිහි සමාජයට සිදුවන සේවා 2 ක් ලියා කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

(මුළු ලකුණු 10)

03 (i) ඉවසීමේ ගුණය දක්වන ජාතක කතාවක් නම් කරන්න. (ල. 02)

(ii) ඉවසීමේ ගුණය දක්වන ආත්තෝපදේශ 2 ක් ලියන්න. (ල. 03)

(iii) ඉවසීමෙන් අපට ලැබෙන ආනිශංස 5 ක් ලියන්න. (ල. 05)

(මුළු ලකුණු 10)

04 (i) වැඩිහිටියන් වෙනුවෙන් අප ඉටුකළ යුතු යුතුකම් 2 ක් ලියන්න. (ල. 02)

(ii) ආගන්තුක සත්කාරයේ දී ඔබට කළහැකි දේවල් 5 ක් ලියන්න. (ල. 03)

(iii) අග්‍රශෂ්‍ය දානය කෙටියෙන් හඳුන්වන්න. (ල. 05)

(මුළු ලකුණු 10)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

05 (i) සමස්ථ සමාජය දෙස එක පැත්තකින් පමණක් බැලීම හඳුන්වන නම ලියන්න. (ල. 02)

(ii) අටලෝ දහම නම් කරන්න. (ල. 03)

(iii) නියාම ධර්ම 5 නම් කර හේතුව ලියන්න. (ල. 05)

(මුළු ලකුණු 10)

06 (i) චතුරාර්ය සත්‍ය දක්වෙන්නේ කුමන සූත්‍රයේ ද? (ල. 02)

(ii) තෘෂ්ණාවේ ආකාර 3 කි. නම් කරන්න. (ල. 03)

(iii) ආර්ය අෂ්ඨාංගික මාර්ගය පිළිවෙලින් නම් කරන්න. (ල. 05)

(මුළු ලකුණු 10)

07 (i) මිහිඳු මාහිමි බුදු දහම ගෙන ලංකාවට වැඩියේ කුමන පෝය දිනක ද? (ල. 02)

(ii) මහින්දාගමනයට පෙර ලක්වැසියෝ කුමන ඇදහිලිවලට පුරුදු වී සිටියේ ද? ඇදහිලි 3 ක් නම් කරන්න. (ල. 03)

(iii) මහින්දාගමනයෙන් අප ලත් දායාද 5 ක් ලියන්න. (ල. 05)

(මුළු ලකුණු 10)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**7 ශ්‍රේණිය** | **අනාවරණ පරීක්ෂණය 2021** | **බුද්ධ ධර්මය**

## පිළිතුරු පත්‍රය - I කොටස

(01) iii (02) i (03) ii (04) iii (05) iv (06) අරහං
(07) 09 (08) තොටගමුවේ ශ්‍රී රාහුල හිමි (09) කරණීයමෙත්ත (10) අනේපිඬු සිටුතුමා
(11) ✓ (12) ✓ (13) ✗ (14) ✓ (15) ✗ (16) v (17) iv (18) ii
(19) i (20) iii

(ලකුණු = 40)

## II - කොටස

01 (1) බුදු සිරුරින් බුදු රැස් විහිදීම
(2) රජ්ජුමාලා, කිසාගෝතමිය, පටාචාරා
(3) අරහං, සම්මා සම්බුද්ධ, සුගත, ලෝකවිදූ
(4) චාරිත්‍ර - අප විසින් පුරුදු පුහුණු කළ යුතු හොඳ දේ
වාරිත්‍ර - අප විසින් නොකළ යුතු දේවල්
(5) * හිස් වැසුම්, පාවහන් ගලවා පන්සල් බිමට පිවිසීම.
* කුණු කසල තිසි පරිදි බැහැර කිරීම.
* චාම් ඇඳුමකින් සැරසී යාම.
* වතාවත්වලට කලින් දැත් සේදීම.
(6) දක්‍ෂයකු වීම / අවංක බව / කීකරුකම / මෘදු බව / අනතිමානි වීම / ලද දෙයින් සතුටු වීම
(7) සුජාතා සිටු දේවිය
(8) මැනවින් හික්මවීම / මැනවින් ඉගැන්වීම / සියලු ශිල්ප ඉගැන්වීම / සියලු මිතාදීන්ට හඳුන්වා දීම / අපට රැකවරණය සැලසීම
(9) බැතිපෙම් උපදවා - අකුරු උගනී කුමරු සොඳවා
(10) බුද්ධරත්නය, ධම්මරත්නය, සංඝරත්නය (ලකුණු 1 x 10 = 10)

02 (i) 1. පාණාතිපාතා වේරමනී සික්ඛා පදං සමාධියාමි
2. අදින්නාදානා වේරමනී සික්ඛාපදං සමාධියාමි
3. කාමේසු මිච්ඡාචාරා වේරමනී සික්ඛාපදං සමාධියාමි
4. මුසාවාදා වේරමනී සික්ඛාපදං සමාධියාමි
5. සුරාමේරය මජ්ජපමා දට්ඨානා වේරමනී සික්ඛාපදං සමාධියාමි
(ii) විරතිය - අකුසලයෙන් වෙන්වීම
සමාදානය - කුසලයෙහි නිරත වීම
(iii) සාමය, සමගිය ආරක්ෂා වීම / මිත්‍රත්වය වර්ධනය වීම / ගුණ ගරුක සමාජයක් බිහිවීම / සොර සතුරු බිය නැතිවීම / මෛත්‍රිය වර්ධනය

03 (i) ක්ෂාන්තිවාදී ජාතකය
(ii) ඉවසීමෙන් සැලසීම ලැබේ. / ඉවසන දනා රුපු යුධයට ජය කොඩිය.
(iii) දෙවියන්ට, මිනිසුන්ට, අමනුෂ්‍යයන්ට ද ප්‍රිය වීම / සතුරන් නැති මිතුරන් බහුල පුද්ගලයකු වේ. / සාමකාමීව සහජීවනයෙන් කල් ගෙවන්නෙක් වේ. / මුලාවට පත්නොවී ප්‍රසන්න සිතුවිලි වලින් යුතුව මරණයට පත්වේ. / මරණින් මතු දුගතිගාමී නොවී සුගතියේ උපදී.

04 (i) ආහාරපාන සපයා දීම. / ඔවුන්ගේ කටයුතු ඉටුකර දීම. / වස්ත්‍රාභරණ සපයා දීම. / දයාව, කරුණාව දක්වීම.
(ii) අසුන්ගත කරවීම. / කරුණාබර වදන්වලින් කතා කිරීම. / බත බුලතින් සංග්‍රහ කිරීම. / පිළිසඳරේ යෙදීම. / ඉදිරිපස දොර, ගේට්ටුව ආදිය විවෘතව තැබීම.
(iii) අස්වැන්නේ පළමු කොටස ත්‍රිවිධ රත්නය උදෙසා පූජා කිරීම.

05 (i) ඒකංගදස්සී වීම
(ii) ලාභ අලාභ / යස - අයස / නින්දා - අපහස / සැප - දුක
(iii) උතු නියාම - කාලගුණික හේතු
බීජ නියාම - උද්භිද විද්‍යාත්මක හේතු
කම්ම නියාම - කර්මානුරූප හේතු
ධම්ම නියාම - ලෝක ධර්මතා ආශ්‍රිත හේතු
චිත්ත නියාම - සිතුවිලි මුල්කොගත් හේතු

06 (i) දම්සක් පැවතුම් සූත්‍රයේ
(ii) කාම තන්හාව / භව තණ්හාව / විභව තණ්හාව
(iii) සම්මා දිට්ඨි / සම්මා සංකප්ප / සම්මා වාචා / සම්මා කම්මන්ත / සම්මා ආජීව / සම්මා වායාම / සම්මා පති / සම්මා සමාධි

07 (i) පොසොන් පොහෝ දිනක
(ii) ඉරහඳ වැනි ස්වභාවික වස්තු / ගස් ගල් වැනි දේ / සත්ව වන්දනා / දේව වන්දනාව / මළවුන් වන්දනාව
(iii) ස්ථිර ආගමක් ලැබීම (බුදු දහම පදනම් කරගත්) / සංස්කෘතිමය දායාද / අර්ථවත් දිවි පෙවතකට හුරුවීම / බෞද්ධ ඉගැන්වීම් (දසරාජ ධර්ම, සතර සංග්‍රහ වස්තු) / ජාතික, ආගමික පුනර්ජීවනය